


කතාව : මිහිරාවි එදිරිසිංහ.

චිත්‍ර : කේ.ජී. ශ්‍රිනිත ගමගේ.

# අපේක්ෂා නොවන චාරිකාව



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

පාසලේ සීනුව නාදවුණ ගමන් ඔක්කොම ළමයි තමන්ගේ පන්ති කාමර වලට දුවගෙන ගියා. උදේ කාල පරිච්චේදයෙ තිබුණේ පරිසරය විෂය නිසා පන්තියේ ඔක්කොම ළමයි තමන්ගේ සටහන් පොත් සූදානම් කරගත්තා.

ටික වෙලාවකින් පන්තිභාර ගුරුතුමිය ගොඩාක් සතුටින් පන්තියට ආවා.



දරුවනේ මේ අහන්නකෝ......

හැම අවුරුද්දකට පාරක්ම අපිට පරිසර චාරිකාවක් යන්න තියනවනේ, අපි මේ සැරේ යන්න ඉන්නෙ ගාල්ල කොටු පවුර බලන්න. ළමයි ගොඩාක් නැති නිසා අපි කෝච්චියේ යන්න තමයි හිතාගෙන ඉන්නෙ, ඒ අත්දැකීමත් ඔයාලට ගොඩාක් වටිනවනේ.

ඒක හොඳයි ටීචර්.... මං නම් ගාලු කොටුව බලන්න ගිහිල්ලම නෑ. ජානු නැගිටලා කිව්වා.

අපිත් ගිහින් නෑ ටීචර් පන්තියේ අනෙක් ළමයි ටිකත් කෑගහන්න පටන්ගත්තා.

හරි එහෙනම් චාරිකාව යන්න කැමති ළමයි ගෙවල් වලින් අවසර අරගෙන උවමනා කරන දේවල් අරගෙන සිකුරාදා උදේම දුම්රියපොලට එන්න ඕනා.